# 07 පන්සල් යමු

ඉක්මනට ලෑස්ති වෙන්න පුතා...

දුව, සුදු ඇඳුමක් අඳින්න.

අම්මේ, අන්න ශිවානි සුරාජ් එක්ක එනවා.

අපිත් එක්ක පන්සල් යන්න.



දුව, මල් වට්ටියයි,

හඳුන්කූරු පෙට්ටියයි

ගන්න.

පුතා, තෙල් බෝතලයයි,

පහන් තිරයි අරගෙන එන්න.

අපි දැන් පන්සල් යමු.

පුතා සුරාජ්, ඔය සෙරෙප්පු, තොප්පි ගලවන්න.

බලන්න ඔය බෝඩ් එක,

**"පාවහන් හිස් වැසුම් ගලවා ඇතුළු වන්න"** කියලා

ඒකේ තියෙනවා නේද?




මේවා කොහේ ද තියන්නේ?

සෙරෙප්පු අර අතන තියන්න පුතා.

තොප්පිය සාක්කුවේ

දාගන්න පුළුවන් නේද?

ශිවානි, දැන් යමු

මල්වලට පැන් ඉසින්න.

මාලිකා, පැන් තියෙන්නේ

කොහේ ද?

අර තියෙන්නේ

බෝඩ් එකක්,

**"මුහුණ කට සේදීමෙන් වළකින්න"** කියලා.

වතුර කරාමය තියෙන්නේ එතන.

අපි ඒ කරාමයෙන් වතුර අරන් මල්වලට ඉහිමු.

හා හා, **නිශ්ශබ්ද වෙන්න.**




දුව, ඔය නෙළුම් මල්වල නටුයි, හිස් හඳුන්කූරු පෙට්ටියයි

අර කසළ භාජනයට දාලා එන්න.

අර තියෙන්නේ අතන බෝඩ් එකක්

**"අපද්‍රව්‍ය කසළ බඳුන්වලට දමන්න"** කියලා.

හැමතැන ම **"විනීත ව හැසිරෙන්න"** කියලා

ලියලා තියෙනවා නේද කසුන්?

අර තවත් බෝඩ් ගොඩක් තියෙන්නේ...

එන්න, ඒවා කියවලා එමු.

**"ජංගම දුරකථන ක්‍රියා විරහිත කරන්න."**

අර කරාමය ළඟ තියෙන එක,

**"ජලය බීමට පමණයි."**

අර අතන, **"ඡායාරූප ගැනීමෙන් වළකින්න."**

අර ඇත බැම්මෙත් එකක් තියෙනවා.

**"බැම්ම මත වාඩිවීමෙන් වළකින්න."**

අන්න අම්මා කතා කරනවා.

මේ පහන් තිර තියලා පහන්වලට තෙල් දාන්න.

අර පහන් වැට හරි ම ලස්සන යි.

එන්න, මෙතැන ඉඳගෙන වඳින්න පුළුවන්.

දැන් හැමෝම වැඳ ගන්න.

සාදු! සාදු! සාදු!

## වචන මාලාව

ලෑස්ති වෙන්න - தயாராகுங்கள்

සුදු ඇඳුමක් අඳින්න - வெள்ளை ஆடை அணியுங்கள்

සෙරෙප්පු - செருப்பு

තියන්න - வையுங்கள்

තොප්පිය - தொப்பி

ගලවන්න - கழட்டுங்கள்

මල්වලට - பூக்களுக்கு

නිශ්ශබ්ද වෙන්න - அமைதியைப் பேணுங்கள்

බීමට පමණ යි - குடிப்பதற்கு மட்டும்

ඡායාරූප ගැනීමෙන් වළකින්න - புகைப்படம் எடுப்பதை தவிர்த்துக்கொள்ளுங்கள்

## ක්‍රියාකාරකම 01

**පිළිතුර තෝරමු. යටින් ඉරක් අඳිමු.**
**விடையை தெரிவு செய்வோம்.கீழ்க் கோடிடுவோம்**

1. පන්සල් ගිය පිරිස ........... (තුන් දෙනෙකි/පස් දෙනෙකි.)
2. පහන්වලට දමන්නේ .................... (පැන් ය/තෙල් ය.)
3. මල්වලට ඉසින්න පැන් ගත්තේ.....................................
(කරාමයෙන්/ළිඳෙන්) ය.
4. සාක්කුවේ දාගන්න කීවේ ...............................................
(සෙරෙප්පු/තොප්පිය)
5. අම්මා දුවට අඳින්න කිව්වේ ............(සුදු පාට/රතු පාට)
ඇඳුමකි.

## ක්‍රියාකාරකම 02

**ගළපමු. කියවමු. ලියමු.**
**இணைப்போம், வாசிப்போம், எழுதுவோம்.**

**උදාහරණය:-** අපි කොඩි වැල් එල්ලමු.

| | | |
|---|---|---|
| අපි | සෙරෙප්පු<br>මල්<br>පහන්<br>හඳුන්කූරු<br>කොඩිවැල්<br>ස්වාමීන් වහන්සේට | පත්තු කරමු<br>දල්වමු<br>පූජා කරමු<br>වඳිමු<br>එල්ලමු<br>ගලවමු |

## ක්‍රියාකාරකම 03

**පිළිතුරු කියමු. ලියමු.**

விடை சொல்வோம், எழுதுவோம்.

1. පන්සලට අඳින ඇඳුම්වල පාට කුමක් ද? ......................
2. දුවට ගන්න කීවේ මොනවා ද? .....................................
3. පුතාට ගන්න කීවේ මොනවා ද? ...................................
4. පන්සලේ දොරටුව ළඟ දී ගලවා
   ඉවත් කළේ මොනවා ද? ...................................................
5. මල්වලට ඉසින්නේ මොනවා ද? ..................................

## ක්‍රියාකාරකම 04

**පාඩමේ ඇති උපදෙස් පුවරු කියවා හිස්තැන් පුරවමු.**

*பாடத்தில் தரப்பட்டிருக்கும் அறிவுறுத்தல்களை வாசித்து இடைவெளி நிரப்புக.*

1. පාවහන් හා හිස්වැසුම් ගලවා ..............................
2. මුහුණකට සේදීමෙන් ....................................
3. නිශ්ශබ්ද .......................................
4. අපද්‍රව්‍ය කසළ බඳුන්වලට .....................................
5. විනීත ව ...............................................

# ක්‍රියාකාරකම 05



## ප්‍රහේලිකාව

| | | | | |
|---|---|---|---|---|
| 1 වි | | ළු | ■ | 2 ති |
| | ■ | ■ | 3 | |
| ත | ■ | ■ | ව | ■ |
| ■ | ■ | 4 ප | | |
| 5 | ල් | ■ | න් | ■ |

## උපකාරක පද

<u>හරහට</u>

1. පන්සලේ දී කිරීම සුදුසු නො වේ.
4. පන්සලේ දී මේවා පත්තු කරයි.
5. පන්සල් ගොස් පූජා කරන දෙයකි.

<u>පහළට</u>

1. පන්සලේ දී මේ ලෙස හැසිරිය යුතු ය.
2. පහන් දල්වන විට මේවා දමන්න.
3. පන්සලට පැලඳ ගෙන ඇතුළු වන්න එපා.

## ක්‍රියාකාරකම 06

**පාසලේ දී ඔබ දකින උපදෙස් පුවරුවල ඇති උපදෙස් 5ක් ලියන්න.**

*பாடசாலையில் அறிவித்தல் பலகையில் நீங்கள் காணக்கூடிய அறிவுறுத்தல்கள் 5 எழுதுங்கள்.*

1. ..................................................................................

2. ..................................................................................

3. ..................................................................................

4. ..................................................................................

5. ..................................................................................